# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

අංක 2184/6 - 2020 ජූලි මස 13 වැනි සඳුදා - 2020.07.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* :අඹකෝ/3/4/අ/137.
*ඉඩම් අමාත්‍යාංශ යොමු අංකය* : LD/05/2004/PC/200.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර :*

නුවරඑළිය දිස්ත්‍රික්කයේ අඹගමුව කෝරළය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 319 ඊ බගවන්තලාව ග්‍රාම නිලධාරී වසමේ බගවන්තලාව ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් සකස් කරන ලද 2012.12.20 දිනැති මු.පි.නු. 2838 හි කැබලි අංක 01 වශයෙන් සඳහන් හෙක්ටයාර 0.0712 පමණ වූ බොගවාන වත්ත (බ්‍රිඩ්වෙල් කොටස) නැමති ඉඩම් කොටස්.

01. **කැබලි අංක 01** – ඉඩමේ නම: –; හිමිකම් කියන්නන්: සීමාසහිත බගවන්තලාව වැවිලි සමාගම, අංක 540, තිඹිරිගස්යාය පාර, කොළඹ 05; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0712.

*මායිම්:*

*උතුරට*: බොගවාන වත්ත (බ්‍රිඩ්වෙල් කොටස); *නැගෙනහිරට*: බොගවාන වත්ත (බ්‍රිඩ්වෙල් කොටස); *දකුණට*: බොගවාන වත්ත (බ්‍රිඩ්වෙල් කොටස) සහ වතු පාර; *බටහිරට*: වතු පාර සහ බොගවාන වත්ත (බ්‍රිඩ්වෙල් කොටස).

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් බලයලත් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2020.10.14 වැනි දින පෙ.ව. 10.00 ට අඹගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 2020.09.28 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරයක් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දනුම්දිය යුතුයි. හිමිකම් කීම පිළිබඳ ඔප්පු ආදිය පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය.

සිතාරා රුවිනි ගමගේ,
ප්‍රාදේශීය ලේකම්,
අඹගමුව කෝරළය.

2020 ජූලි මස 09 වැනි දින,
අඹගමුව කෝරළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

07 - 725


මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* :අඹකෝ/3/5/අ/146.
*ඉඩම් අමාත්‍යාංශ යොමු අංකය* : 4/3/2/2011/FR/82.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර :*

නුවරඑළිය දිස්ත්‍රික්කයේ අඹගමුව කෝරළය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 319 බී හැටන් උතුර ග්‍රාම නිලධාරී වසමේ හැටන් පුල්බෑන්ක් වත්ත ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් සකස් කරන ලද 2019.12.21 දිනැති මු.පි.නු. 3351 හි කැබලි අංක 01, 03 වශයෙන් සඳහන් හෙක්ටයාර 0.0626 පමණ වූ හැටන් වත්ත නැමති ඉඩම් කොටස්.

01. **කැබලි අංක 01** – ඉඩමේ නම: හැටන් වත්ත; හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව, අංක 475, කඩුවෙල පාර, බත්තරමුල්ල; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0094.

***මායිම්:***

*උතුරට*: මාර්ගය (නගර සභාව); *නැගෙනහිරට*: මාර්ගය (නගර සභාව) සහ 2 වැනි බිම් කැබැල්ල; *දකුණට*: 2 වැනි බිම් කැබැල්ල සහ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන හැටන් වත්ත; *බටහිරට*: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන හැටන් වත්ත සහ මාර්ගය (නගර සභාව).

02. **කැබලි අංක 03** – ඉඩමේ නම: හැටන් වත්ත; හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව, අංක 475, කඩුවෙල පාර, බත්තරමුල්ල; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0532.

***මායිම්:***

*උතුරට*: 2 වැනි බිම් කැබැල්ල සහ මාර්ගය (නගර සභාව); *නැගෙනහිරට*: මාර්ගය (නගර සභාව); *දකුණට*: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන හැටන් වත්ත සහ ඇළ; *බටහිරට*: ඇළ සහ 2 වැනි බිම් කැබැල්ල.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් බලයලත් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2020.10.07 වැනි දින පෙ.ව. 10.00 ට අඹගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 2020.09.21 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරයක් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුය. හිමිකම් කීම පිළිබඳ ඔප්පු ආදිය පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය.

සිතාරා රුවිනි ගමගේ,
ප්‍රාදේශීය ලේකම්,
අඹගමුව කෝරළය.

2020 ජූලි මස 08 වැනි දින,
අඹගමුව කෝරළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

07 - 732

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.